C
294.3
WAN

# ශ්‍රී ලංකාවේ

# වර්තමාන බෞද්ධ භික්ෂු නිකාය පිළිබඳ විචාරාත්මක විමසීම .

උණ්ණෑගමුවේ වංගීස හිමි.
ලි: පෑ: අංකය. පී.එච්.ඩී/බී එස්/84/1005

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දර්ශනශූරි (ආචාර්ය) උපාධිය සඳහා ඉදිරිපත් කරන නිබන්ධනය.

442878

# පෙරවදන .

ශ්‍රී ලංකාවේ වර්තමාන භික්ෂු ශාසනය පිළිබඳව කරුණු සෙවීමට මට සිත් වූයේ පැවිදි වී ටික කලකිනි. අපවත්වී වදාළ මාගේ ගුරුදේව රාජකීය පණ්ඩිත කාදුගල චන්දවිමලාභිධාන ලොකු හාමුදුරුවන් වහන්සේ සමග ඥාති ගෙදරක අවමඟුල් උත්සවයකට සහභාගී වීමට ගිය අවස්ථාවේදී ඇති වූ සිද්ධියක් මීට හේතු විය. එම මළ ගෙදරට යාමට කලින් යුතුකමක් ලෙස සලකා, ගමෙහි පන්සලට ද යාමට අදහස්කොට සංඝාවාස ගොඩනැගිල්ල දෙසට ගියෙමු. එවිට එහි අධිපති හිමිපාණන් සංඝාවාසයේ දොරටුව ඉදිරියට පැමිණ ධර්මශාලාවට යන්නට අපට අණකරණ ලදී. ඒ බලා සිටි එහි පැමිණි සෙසු භික්ෂූන් වහා පැමිණ ලොකුහාමුදුරුවන්ට සංඝාවාසයට වඩින ලෙස ආරාධනා කළත් ධර්මශාලාව වෙතම ගියහ. එම ආරාමාධිපති හිමියන්ට එහි සිටි සමහර භික්ෂූන් දොස් පවරනු මට ඇසුනි. අලුත පැවිදිවූ මට මෙය මහත් ගැටළුවක් විය. එම ආරාමාධිපති හිමිපාණන් වහන්සේ අප කෙරෙහි දැක්වූ ආකල්පය පිළිබඳව, ලොකු හාමුදුරුවන්ගෙන් විමසුවත් එයට පිළිතුරක් ලැබුනේ නැත. කල්යත්ම කරුණු අවබෝධ විය. නිකායන් වශයෙන් බෙදී සිටින නිසා මෙබඳු සිද්ධීන් සිදුවන බව තේරුම් ගතිමි. එදා තත්ත්වය එසේ වුවත් වර්තමානයේ නිකායාන්තරික සම්බන්ධය ඉතා සතුටුදායකය. හරයක් නැති මෙම බෙදීම පිළිබඳව කරුණු සෙවීමට මා තුළ ආශාවක් ඇතිවිය. එහෙත් මෙවැන්නක් ගැන තොරතුරු සෙවීමෙන් ප්‍රයෝජනයක් තිබිය යුතුය.

දර්ශනශූරී උපාධිය සඳහා පර්යේෂණයක් කිරීමට අදහස් කළ මම, මෙම මාතෘකාව සුදුසුයයි **තෝරා ගතිමි** . ඒ අනුව "ශ්‍රී ලංකාවේ වර්තමාන බෞද්ධ නිකාය පිළිබඳ විචාරාත්මක විමසීම" යනුවෙන් මාතෘකාව සකස්කොට පේරාදෙණි සරසවියේ බෞද්ධ අධ්‍යයන අංශයට යොමු කළෙමි. මෙම මාතෘකාව විශ්ව විද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන අංශයෙන් හා විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන මණ්ඩලයෙන් ද, අනුමතවීම නිසා අදාළ කාර්යයෙහි නිරතවීමි. එය අවසන්කොට නිබන්ධනය ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

මෙම මාතෘකාව ඉතා ව්‍යාකූල වූවකි. කරුණු සොයා ගැනීමට මුළු දිවයින පුරාම ගවේෂණය කරමින් චාරිකා කිරීමට මට සිදුවිය. නිකායික මූලස්ථාන, පැරණි විහාරස්ථාන, පිරිවෙන්, පුස්තකාල , විශ්ව විද්‍යාල, රාජ්‍ය ලේඛණාගාර සහ බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව හා කෞතුකාගාර වැනි ස්ථානවල ඇති පැරණි පොත් පත්

ලියකියවිලි, සන්නස්, ශිලා ලේඛණ පරිශීලනය කළෙමි. තරුණු සෙවීමේදී මෙම ස්ථාන වල බලධාරීන්ගෙන් ලැබුණු සහයෝගය ඉතා අගය කරමි. එහෙත් ඇතැම් තරුණු ප්‍රකාශ කිරීමට සමහර මහනාහිමි වරුන් වහන්සේලා මැලිවූහ. ඒ නිසා ඇතැම් තීරණයන් පිළිබඳව ස්ථිර නිගමනයන් කිරීම අපහසුවිය. කෙසේ වෙතත් දරණලද ප්‍රයත්නය තරමක් දුරට හෝ සාර්ථක වන්නට ඇතයනු මගේ හැඟීමයි.

මෙම ග්‍රන්ථය ලිවීමෙන් මා අදහස් කලේ වර්තමාන බෞද්ධ නිකාය භේදය පිළිබඳව අප නොදන්නා තරුණු ඉදිරිපත් කිරීමයි. එක් එක් නිකාය උසස්කොට දැක්වීමට හෝ පහත්කොට දැක්වීමට මෙහිදී මම කිසිසේත් අදහස් නොකළෙමි. මෙහිදී විවිධ කුල වංශයන් පිළිබඳව තරුණු සටහන් කිරීමට සිදුවිය. එහෙත් එසේ කරන ලද්දේ නැමත්තකින් නොවේ. හුදෙක් එසේ කලේ නිකාය භේදය පිළිබඳව යථා තත්ත්වය පැහැදිලි කිරීමටයි. මෙම නිබන්ධනය පරිච්ඡේද අටකින් යුක්තය. ඉන්පසු කෙටි උප ග්‍රන්ථයන් ද යොදා ඇත. විශේෂයෙන්ම අමරපුර මහා නිකාය පිළිබඳව තරුණු සෙවීම හා එම තරුණු ගොනුකර ගැනීම දුෂ්කර කාර්යයක් විය. තත්නිකායික ඇතැම් මහනාහිමිවරුන්ගෙන් පවා තම නිකාය පිළිබඳව පැහැදිලි විස්තරයක් ලබා ගැනීමට නොහැකි විය. එසේම නිකායයන් සතු ඓතිහාසික වාර්තා නොමැතිවීම ද තවත් බාධකයකි. සම්ප්‍රදායන් පිළිබඳව තරුණු ලිවීමේදී ඒ පිළිබඳ යම් යම් තරුණු සපයාගතහැකි වූයේ සාකච්ඡා මාර්ගයෙන් හා සියැසින් දැකීමෙනි.

මේ කාර්යය සාර්ථක කරගැනීම සඳහා විවිධාකාරයෙන් මට සහාය වූ ගිහි පැවිදි බොහෝ පිරිසක් වෙති. එම සියළුදෙනා අතුරෙන් ප්‍රථමයෙන් ගුරු ගෞරවයෙන් සිහිපත් කළයුත්තේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ගරු තඹුරුපිටියේ අරියසේන හිමිපාණන් වහන්සේ ය. ලියාපදිංචිවීමට අවශ්‍ය මූලික වැඩකටයුතු ඉතා ඕනෑකමින් සකස්කර දීමෙන් මෙම ස්වාමීන්ද්‍රයන් වහන්සේ මහත්සේ උපකාරී වූහ. එසේම මාතෘකාව අනුමත කිරීමෙන් හා උපදෙස්දී අඩුපාඩු සකස්කර දෙමින් සෑම සහයෝගයක් දුන් බෞද්ධ අධ්‍යයන අංශයේ ප්‍රධාන මහාචාර්ය සී.විතානාච්චි මැතිතුමා කෘතඥතා පූර්වකව ගුරු ගෞරවයෙන් සිහිපත් කරමි. එසේම ග්‍රන්ථය සැකසීමේදී උපදේශකත්වය දැරූ ආචාර්ය යටගම ධම්මපාල හිමිපාණන් වහන්සේට ස්තූති කළයුත්තේ ද ගුරු ගෞරවයෙනි. අඩුපාඩු සකස් කරමින් අදාල උපදෙස් දෙමින් දැක්වූ සහයෝගය නිසා මෙම බැරෑරුම් කාර්යය අවසන් කරගතහැකි විය. එසේම

විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන සභාව හා කාර්‍ය මණ්ඩලය මාතෘකාව අනුමත කිරීමෙන් දෙනලද සහයෝගය අගය කරමි.

තරුණු සොයා ගැනීමේදී මට සහාය වූ අදාල නිකායන්හි හා පාර්ශවයන්හි මහානායක, අනුනායක හා ලේඛනාධිකාරී හිමිවරුන් වහන්සේලා දැක්වූ සහාය ඉතා ගෞරවයෙන් සිහිපත් කරමි. මල්වතු විහාරයේ ගරු අලුත්ගම ධම්මානන්ද හිමිපාණන් වහන්සේ ද අමුණුගම රතනජෝති හිමිපාණන් වහන්සේ ද දැක්වූ අනුග්‍රහය, මෙම ග්‍රන්ථය සකස්කර ගැනීමට මහෝපකාරී විය. මාගේ ගුරුකුලයන් වන වලස්ගල සිරි සරණංකර පිරිවෙණ හා මාතර කිතුලේවෙල ජයමහා විහාර උපාධි පීඨය පොත්පත් සපයාදීම් ආදියෙන් දක්වන ලද සහාය අගයමි. එසේම සෑම කටයුත්තකදී ම තන්අයුරින් සහයෝගය දෙන හිතවත් ගිහි පැවිදි සහෝදර පිරිස් දක්වන ලද සහයෝගය කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. දෙහිවල ධර්මරාජ විහාරාධිපති ශාස්ත්‍රවේදී ගරු, මාතඳුරේ සිරි සුමන හිමිපාණන්ගෙන් ලැබුණු සහාය සඳහන් නොකරම බැරිය. මාගේ ගුරුදේවයන් වහන්සේ නැති පාඩුව පිරිමසමින් හැම අතින්ම මට සහාය දක්වන කිට්ටඹුව ශාරිපුත්‍ර විද්‍යා පීඨාධිපති, පණ්ඩිත ශාස්ත්‍රවේදී ගරු අත්තුඩාවේ චන්දසිරි හිමිපාණන් වහන්සේ ද, ගරු වටගෙදර පඤ්ඤානන්ද හිමිපාණන් වහන්සේද ගෞරවයෙන් සිහිපත් කරමි. එසේම මුල්ගිරිගල උදිත, මුරුත්ගස්යායේ පදුම, පාතේගම චන්දිම, රත්තේ ඉන්දසිරි යන අපගේ ශිෂ්‍යයන්ගෙන් ලැබුණු සහායද ඉතා වැදගත් ය. එසේම නාදුගල සිරි විමලාරාමස්ථ දායක සභාවේ සභාපති පීනදාස කුමාණායක මහතාණන් ප්‍රධාන දායක දායිකාවන්ගෙන් ලැබුණු සහායද අගයමි.

අත්පිටපත කීපවාරයක්ම සකස්කර ගැනීමට සිදුවූ හෙයින් වෙහෙස නොබලා එම කටයුතුවල නිරතවූ මාතර ශ්‍රී සුදර්ශී උපාධි පීඨයෙහි ආචාර්ය ශාස්ත්‍රවේදී කාරපේලියේ සෝරත හිමියන්ටත්, දමයන්ති රූබසිංහ ජයවර්ධන හා හේමකුමාරි මුරමුදලි යන අපගේ ශිෂ්‍යාවන් දෙදෙනාටත් ස්තූති කරමි. එසේම බස්වහර සකස් කරගැනීමට උපදෙස් දුන් වලස්ගල සිරි සරණංකර පිරිවෙණ් පතිව සිටි පණ්ඩිත ගැටමාන්නේ පීනානන්ද හිමිපාණන් වහන්සේ ද සිහිපත් කරමි. එසේම මෙම නිබන්ධනය යතුරු ලියනයෙන් පිටපත් කර දුන් මාතර කෘෂිකර්ම කාර්‍යාලයේ සුමණසේන කුලතන්තිල මහතාටත්, පහල පින්වැල්ල පඤ්ඤාරාම වාසී ගරු ඌරුමුත්තේ සෝමරතන හිමිපාණන් වහන්සේටත් විශේෂ ස්තූතිය හිමිකරමි.

මෙයට,
ඌරුගමුවේ වංගීස හිමි.

බෞද්ධ අධ්‍යයන අංශය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
පේරාදෙණිය. 1991.10.10 වැනි දින.